# රළ

විප්ලවයේ නිදහස උදෙසා කලාව!
කලාවේ පරිපූර්ණ නිදහස උදෙසා විප්ලවය!

කලා - සංස්කෘතික අතිරේකය

2024 මාර්තු




# ඔබ දැන් කරමින් ඉන්න දේ!

**ගිනි තබා ගෙන මිය ගිය අමෙරිකානු සෙබළාගේ ප්‍රශ්නය**

පසුගිය පෙබරවාරි 25 වැනිදා අමෙරිකා එක්සත් ජනපද ගුවන් හමුදා සාමාජිකයකු සිය ජීවිත කාලයේ අවසන් වචන අන්තර්ජාලයේ සජීව ලෙස විකාශය කළේය. එහිදී ඔහු ප්‍රකාශ කළේ මෙයයි.

*"මගේ නම ආරොන් බුෂ්නෙල්. මම එක්සත් ජනපද ගුවන් හමුදාවේ ක්‍රියාන්විත රාජකාරි සාමාජිකයෙක්. මම තවදුරටත් ජන සංහාරයට හවුල් නොවන්නෙමි. මම දැන් සූදානම් වන්නේ ආන්තික විරෝධතා ක්‍රියාවක නිරත වීමටය. නමුත් පලස්තීනයේ මිනිසුන් සිය යටත් විජිතවාදීන් යටතේ අත්විඳින දේවල් සමඟ සසඳන විට, එය කිසිසේත්ම අන්තයේ ඇති දෙයක් නොවේ. එහෙත්, අපේ පාලක පන්තිය විසින් එය සාමාන්‍ය දෙයක් බවට තීරණය කර ඇත. නිදහස් පලස්තීනයක්! නිදහස් පලස්තීනයක්! නිදහස් පලස්තීනයක්!"*

ගිනි දල්වා ගත් ආරොන් වේදනාවෙන් කෑ ගසන විට ඔහුට සහාය වීමට ආරක්ෂක නිලධාරියකු ළං වෙද්දී ජුගුප්සාජනක දෙයක් සිදු විය. එනම්, ගිනි අවියක් මානාගෙන පැමිණි තවත් ආරක්ෂකයකු වින්දිතයාට බිම දිගාවන ලෙස විධාන කිරීමය. නමුත්, පළමු නිළධාරියා තම සගයාට දැනුම් දී ඇත්තේ 'මෙතැනට අවශ්‍ය තුවක්කුවක් නොව ගිනි නිවන උපකරණයක්' බවය.

ආරොන් සිය දිවි පිදුමට පැය කීපයකට පෙර තම ෆේස්බුක් මුහුණතේ මෙසේ සටහන් කළේය.

*"අපගෙන් බොහෝ දෙනෙක් අපෙන්ම මෙසේ අසන්නට කැමතියඃ වහල්භාවය ඇති කාලයක ජීවත් වනවා නම් මම කරන්නේ කුමක්ද? Jim Crow South ද? නැත්නම් වර්ණභේදවාදයද? මගේ රට ජන සංහාරයක් කරන්නේ නම් මම කරන්නේ කුමක්ද? උත්තරය තමයි දැන් ඔබ කරමින් ඉන්න දේ"*

25 හැවිරිදි ආරොන් ජේම්ස් බුෂ්නෙල්, 2020 මැයි මාසයේදී එක්සත් ජනපද ගුවන් හමුදාවට සම්බන්ධව එතැන් සිට තොරතුරු තාක්ෂණ සහ සංවර්ධන (ඔත්තු සේවා) මෙහෙයුම්වල සේවය කර ඇත. 2024 මැයි මාසයේ සිය ගිවිසුම්ගත රාජකාරියෙන් සමුගත් පසුව නිව් හැම්ප්ෂයර් විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ උපාධි අපේක්ෂකයකු ලෙස පාඨමාලාවක් හදාරන්නට ඔහු සූදුසුකම් ලබා සිටියේය. එක් අවස්ථාවකදී ආරොන් සිය හිතවතුන්ට පවසා තිබුණේ එක්සත් ජනපද විශේෂ ඒකකවල සෙබළුන් ගාසා තීරයේ උමං මාර්ග තුළ ඝාතනවල යෙදෙන බවට තොරතුරු තමන් දන්නා බවය. කෙසේ වෙතත් එක්සත් ජනපද ආරක්ෂක අංශ මෙම චෝදනාව ප්‍රතික්ෂේප කර ඇත. ආරොන්ගේ සිදුවීමෙන් පසුව ප්‍රකාශයක් නිකුත් කරමින් එක්සත් ජනපද ගුවන් හමුදාව ප්‍රකාශ කළේ ඔහු 531 වන බුද්ධි සහාය බලගණයේ සයිබර් ආරක්ෂක මෙහෙයුම් විශේෂඥයෙකු බවයි.

2023 දෙසැම්බර් මාසයේදී ඇට්ලැන්ටාහි ඊශ්‍රායල් කන්සියුලර් කාර්යාලය ඉදිරිපිටදී විරෝධය දක්වමින් කාන්තාවක් සිරුරට ගිනි තබා ගත් අතර ආරක්ෂකයකු විසින් ඇය වහා ප්‍රතිකාරවලට යොමුකිරීම නිසා ඇගේ ජීවිතය ආරක්ෂා විය. පිලිස්සුම් තුවාල සිදුවුවද ඇය කවුරුන්දැයි ප්‍රසිද්ධියට පත්ව නැත.

*Jim Crow South යනුවෙන් අදහස් කෙරෙන්නේ එක්සත් ජනපදය කල්ලන්ට එරෙහිව යොදාගත් මර්දන නීතියකි.*





# සමාජීය මිනිස් ආත්මය කවියට නැගීම

**ඉසුරු චාමර සෝමවීරගේ 'මමත්වතා' කාව්‍ය කෘතිය පිළිබඳ විචාරාත්මක අදහසක්**

ඉසුරු චාමර සෝමවීර දිර්ඝකාලීන අභ්‍යාසයක් මාර්ග යෙන් ස්වකීය කවියේ භාෂාව, උපමා අලංකාරය දියුණු තියුණු කරගත් කවියෙකි. 'ඒ සුද' (2005) 'තාණ්ඩව' (2011) 'අප දෙදෙන මැද මහ මුහුද' (2016) යන කාව්‍ය කෘති හරහාය. ඉසුරුගේ කවියේ අප ඉහත සඳහන් කළ ආකෘතික ලක්ෂණවල පදනමෙහි ඇත්තේ, බහුතරයේ කතිකාවෙන් බැහැර වන අල්පතරයේ කතිකාවයි. අල්පතරයේ දෘෂ්ටිවාදයට එරෙහි බහුතරයේ ජීවන අත්දැකීමයි. ජීවන අරගලයයි.

"සිහින නිවහන" යන මැයෙන් යුතු පළමු කාවිය 70 දශකයේ ප්‍රකට කවියෙකු වූ පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ 'කුලී ගෙදරකට මාරුවන වගයි' වැනි කවියක් අපට සිහිපත් කරන්නේය.

"මා පසෙක නිදියන,
දහස් පෙති ගාලේ
සමනැලුන් හඹායන,
සුදුම සුදු, නිදිමත
බැළලියෙක් විය අපට"
(1. පිටුව)

කොඩිතුවක්කු කවියාගේ කවියේ එන බළලුන් දෙදෙනා කතකයා ඉදිරියේ නිෂ්ක්‍රිය අසන්නන් දුක්ගන්නාරාලලා දෙදෙනෙකු පමණක් වුවත් ඉසුරුගේ කවියේ එන බැළලිය 'ගෙයින් ගෙට මාරුවීමේ' ඛේදවාචකයේ ඓන්ද්‍රීය ගොදුරුය.

"ඊළඟ කුලී නිවසට
රැගෙන ආවත් ඇය
සංකාවෙන් හිඳ
දිවිනසා ගත්තාය චප්ප වී
ලී ලොරියකට පැන"
සිහින නිවහන (1. පිටුව)

වරින් වර, බලාපොරොත්තු විරහිත ලෙස ජීවන අවකාශ තමාගේ කැමැත්තට පිටින් මාරු කිරීමට සිදුවීමේ මානුෂික ඛේදවාචකය බැළලියක ආශ්‍රයෙන් ප්‍රබලව සංකේතවත් කිරීමට කවියා සමත් වෙයි. එතැනින් නොනවතින කවියා, තමාගෙම නිවසක් පිළිබඳ කුලී නිවැසියා සතු පරාදීසමය සැනසීම ද ධනේශ්වර ක්‍රමය තුළ තවත් එක මයාමය සැනසුමක් පමණක් වන ආකාරයද ඉසුරුගේ කවියේ වැඩිදුරටත් විස්තර වේ.

"තිබේ දැන් මට
මගෙම නිවසක්
වෙන්දේසි ඉඩමක
හතරක් පචස් හයක
අඩු කරමින් සිටිමි
ණය වාරික එකින් එක
බඳිමින් ගඩොල් බැමි"
(සිහින නිවහන)

ලිපිය ආරම්භයේදී පැවසූ ලෙසම ඉසුරුගේ කවියේ, කාව්‍ය අලංකාරය උපදිනුයේ සමාජ ධුරාවලියේ දෙවන තැනට වැටෙන පීඩිතයාගේ දෘෂ්ටියෙනි. ඒ ආර්ථික සබඳතාවලදී සංස්කෘතික සබඳතාවලදී ආදී වශයෙන් එන සකලවිධ මානුෂික සබඳතාවලදීමය. එය ආදරය වැනි විෂයකදී ඉසුරුගේ කවිය තුළ සංකල්පරූපගතවන ආකාරය පහත කවියෙන් නිරීක්ෂණය කළ හැක.

"ප්‍රේමයේ ආලෝක වෘත්තයේ
පරිධියට මඳක් ඇතින්
අසුන මට දෙන්න
..........................
............................
රෝස මල් පොකුරු දෙන
සෙනග තදබදය තුළ
පුරුදු නැහැ මට ඇවිත් තෙරපෙන්න

මං ගෙනා කැලෑ මල්
මග දිගට හලන්නම්
දැක්කොතින් එක දෙකක් අහුලන්න
නොදැක්කොත් ඔබෙ ගමන ඔබ යන්න
කැලෑ මල් ඔහෙ පයට පෑගෙන්න"
(21. පිටුව)

ඒ අනුව ඉසුරුගේ කවියේ දේශපාලනය වනුයේ සමාජීය ප්‍රතිවිරෝධතා අමතකකර දැමීම නොව, ප්‍රතිවිරෝධය හරහා ගමන් කිරීමය. එය පීඩිත පන්තින්ගේ දේශපාලනයට සමීපභාවයක් දක්වනුයේ, ප්‍රතිපක්ෂයන්ගේ අරගලයේදී පීඩිත පක්ෂයේ පැත්තේ සිට ගැනීමෙත්, ප්‍රතිපක්ෂය මග නොහැර ඒ හරහා ගමන් කිරීමේ ස්වභාවයෙනි.

"මූණු, ඇස් අමතක
තොල්, කකුල්, අත් අතර පැටලී
තෙත සෙවල වගුරුවා
ඔක්කාරයට එන විට
කාරා කෙළ ගසා
පිටව එමි.
අඳුරු වැටකේ පඳුරු
ලාභ හෝටල් කාමර

4 පිටුවට